# විශේෂ පුස්තකාල හා වාර සඟරා
## පිළිබඳ කෙටි හැඳින්වීමක්

වයි. කේ. තිස්ස බණ්ඩාර
වැඩබලන පුස්තකාලයාධිකාරී,
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය.

ලෝකයේ තොරතුරු උත්පාදන වේගය ශීඝ්‍රවීමත් සමගම එම තොරතුරු ගබඩා කරන මාධ්‍යවල විවිධත්වය මෙන් ම ප්‍රමාණය ද සංඛ්‍යාත්මකව ඉහළ ගොස් ඇති බව පෙනී යයි. විවිධ තරාතිරමේ අයවලුන් සඳහා විවිධ මට්ටම්වල තොරතුරු දෛනිකව හෝ වරින් වර හෝ අවශ්‍ය වේ. ඓතිහාසික වශයෙන් මැටි පුවරු, ශාඛ පත්‍ර, ගල් පසුතල, කෘතිමපත්‍ර (කඩදාසි) ආදිය මත තොරතුරු සටහන් කෙරුණු තොරතුරු යුග කීපයක්ම අප පසුකර ඇත්තෙමු. නූතනයේදී විදුලි සන්දේශන ක්‍රම සහ පරිගණක ක්ෂේත්‍රයේ දියුණු තාක්ෂණය මත තොරතුරු ක්ෂණිකව සහ පහසුවෙන් ලබාගැනීමේ ක්‍රම දක්වා පරිණාමයට පත්ව සිටිමු. මාධ්‍යය හෝ ප්‍රචාරණය කිනම් පසුබිමකින් පෝෂණය වුවත් තොරතුරු ලබාගන්නා ඉන් සන්තෘප්තියට පත්වන්නේ නම් තොරතුරු කළමණාකරණය කරන්නවුන්ගේ කාර්යය සඵල වන්නේ ය.

පර්යේෂකයින් යනු එකිනෙකට වෙනස් තේමාවක් ඔස්සේ කිසියම් ප්‍රස්තෘතයක් කෙරෙහි නැවත විද්‍යාත්මකව බලන්නා වූ පිරිසකි. එබඳු අය සඳහා යම් යම් ආකාරවල තොරතුරු අත්‍යාවශ්‍ය වේ. මේ පිරිස් විවිධ ආයතන කෙරෙන් තොරතුරු ලබා ගනිති. ඒ අතරින් පුස්තකාලය විශේෂ ආයතනයකි. එහි ද සුවිශේෂ තත්ත්වයක් වන **විශේෂ පුස්තකාලය** පර්යේෂකයන්ගේ ආකර්ෂණීය ආයතනයකි.

**විශේෂ පුස්තකාල** ඒවායේ නමින් ධ්වනිත වන්නාක් මෙන් ම බොහෝ කරුණු වලින් විශේෂත්වයක් උසුලයි. කිසියම් නිශ්චිත විෂයක් හෝ විෂය ගණනාවක් අරභයා පමණක් අවධානය යොමුකිරීම මෙහි විශේෂත්වයයි. විශේෂ පුස්තකාලයක් අනුබද්ධව පවත්නා මවු ආයතනය

කිසියම් නිශ්චිත අරමුණක් සහිතව පැහැදිලිව හඳුනාගත හැකි විෂය ක්ෂේත්‍රයක් හෝ කිහිපයක් ඔස්සේ කටයුතු මෙහෙයවන බැවින් මේ තත්ත්වය ඇතිවේ. විශේෂ පුස්තකාලයක මවු ආයතනය රාජ්‍ය දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, සමිතියක් වැනි ආයතනයක් වේ. ලංකාව ආශ්‍රයෙන් මේ සඳහා නිදසුන් වශයෙන් පහත ආයතන දක්වමු.

### ආගමික ක්ෂේත්‍රවල විශේෂ පුස්තකාල

විශ්වවිද්‍යාල අනුබද්ධ විශේෂ පුස්තකාල
තේ පර්යේෂණායතනායතන පුස්තකාලය
රබර් පර්යේෂණායතනායතන පුස්තකාලය
පොල් පර්යේෂණායතනායතන පුස්තකාලය
වාරිමාර්ග දෙපාර්තමේන්තුව පුස්තකාලය
අපනයන සංවර්ධන මණ්ඩලය පුස්තකාලය
වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය පුස්තකාලය
ජාත්‍යන්තර වාරිකළමණාකරණ පුස්තකාලය
කෘෂිපර්යේෂණායතන පුස්තකාලය යනු ඉන් සමහරකි.

මවු ආයතනයේ අරමුණු සඵල කරගනු වස් විශේෂ පුස්තකාලය සෘජු සම්බන්ධතා දක්වයි. විශේෂ පුස්තකාලයක් පවතින්නේ එහි මවු ආයතනයේ අභිමාර්ථ ඉටු කිරීමට ය. එබැවින් පහත දැක්වෙන සේවාවන් මවු ආයතනයට සැපයීමට විශේෂ පුස්තකාලය වගකියයි.

i. මවු ආයතනයේ සාමාජික ප්‍රජාවට තමන්ගේ විෂයපථවලට අදාළව සිදුවන නව ප්‍රවර්ධන ප්‍රවණතා ආදිය පිළිබඳ තොරතුරු දැනගත හැකි වන පරිදි තොරතුරු සේවා පැවැත්වීම.

ii. මවු ආයතනය විසින් ඇරඹීමට අදහස් කරනු ලබන ව්‍යාපෘතිවලට අවශ්‍ය සාහිත්‍ය ගවේෂණය සිදුකිරීම හා අදාළ තොරතුරු ලබාදීම.

iii. පාඨකයන්ට අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබා දී ඔවුන්ගේ කාලය ඉතිරිකර දීම.

iv. සමතුලිත ග්‍රන්ථ සම්භාරයක් සහ මනා සේවා මගින් පාඨකයන් දිරිමත් කිරීම. එමගින් වඩාත් නිර්මාණශීලි වූත් කාර්යක්‍ෂමව වූත් කාර්යය මණ්ඩලයක් ඇති කිරීමෙහිලා දායක වීම.

v. බාහිර පර්යේෂකයින්ට අවශ්‍ය තොරතුරු ලබා දීමට සහය වීම.





විශේෂ පුස්තකාලවලින් තොරතුරු ලබිදීමේ ප්‍රබලතම මාධ්‍යයක් වශයෙන් වාරසඟරා ඉදිරියෙන් සිටී. විවිධ අධ්‍යයන හා පර්යේෂණ හේතුවෙන් ජනිත වන නව දැනුම පළමුවෙන් ම පාඨකයා වෙත රැගෙන එන මාධ්‍යය වාරසඟරා වේ. පොතක් මෙන් නොව ඉදිරි කාලය තුළ අඛණ්ඩව කඩින් කඩ කිසියම් නිශ්චිත විරාමයකින් යුතුව ප්‍රකාශයට පත්වීම, වාරසඟරාවක මූලික ලක්‍ෂණය වේ. වාරසඟරාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ ඔස්බෝන් (Osborne) මෙසේ දක්වයි.

"විඥාපන මාධ්‍යයක් ලෙස පර්යේෂණ සඳහා අත්‍යාවශ්‍ය වැදගත් තොරතුරු මාධ්‍යයක් ලෙසත් වාරසඟරා පුස්තකාල වලින් බැහැර කළ නොහැකි අත්‍යන්තයෙන්ම අවශ්‍ය තොරතුරු මූලාශ්‍රයකි" වාරසඟරාවක විශේෂ ලක්‍ෂණ දක්වන ඔස්බෝන් මෙසේ ද දක්වයි. "ග්‍රන්ථ නාමයක් තිබීම, මේ ග්‍රන්ථ නාමය යටතේ හෝ පසු කාලීනව ඒ වෙනුවට යොදා ගැනෙන වෙනත් ග්‍රන්ථ නාමයක් යටතේ අඛණ්ඩව මූලික අංක සහිතව ඉදිරි කලාප ප්‍රකාශනය" ලෙසයි.

වාරසඟරාවල ඉතිහාසය දෙස හැරී බලන විට, දළ වශයෙන් වසර තුන්සිය පනහක් තරම් අතීතයකට සම්බන්ධ බව පෙනේ. ලොව ප්‍රථම ශාස්ත්‍රීය වාරසඟරාව ලෙස සැලකෙන්නේ රාජකීය ආසියාතික සමිතිය විසින් 1665 මාර්තු 6 වෙනි දින ප්‍රකාශිත සඟරාවකි. එනම් "Philosophical Transaction : Giving some Account of the present undertaking studies and Labours of the Ingenious in Considerable parts of the world" නැමති වාරසඟරාවට පසුව බොහෝ වාරසඟරා මේ වන විට බිහිවී ඇත.

වාරසඟරා යන්න සඳහා විවිධ අදහස් පවතී. "Periodical" යන්න වඩා යෝග්‍ය වේ. වාරසඟරා පිළිබඳ උනන්දු වූ අය අතර Osborne හා Grenfell ප්‍රධාන වෙති. ඔස්බෝන් දක්වන්නේ "Serial" යන්න උචිත බවයි. නමුත් Periodical හා Serial යන දෙකින්ම කියවෙන්නේද එකම අදහස බව ඔස්බෝන් දක්වයි. Periodiacal යන්න ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝශයට අනුව මෙසේය. "ක්‍රමානුකූළ අන්තරයක් ඇතිව ප්‍රකාශයට පත්කරන දෑය. මේවා සති, මාස, වසර ක්‍රමයෙන් ප්‍රකාශ වේ." යනුයි.

තවත් විටක Periodical සහ Serial යන්නට අමතරව "Journal" ලෙස ද යොදනු පෙනේ. එහි අදහස වන්නේ ද සඟරාව,

පුවත්පත, යන තේරුම් ය. මේ සම්බන්ධ නිර්වචන කෙසේ වෙතත් ඉදිරියේ දී Perioocal යන යෙදුමට අදාළව වාරසඟරා යන්න සාකච්ඡා කෙරේ. මෙය වූ කලී එක්තරා වාර ප්‍රකාශන විශේෂයකි.

Periodical Literature occupies an important place in any special Library because of its coverage of research, new discoverise, methods, invention and latest information in various fields වාරසඟරා වෙනුවෙන් සරලව ඉහත අදහස දැක්වීමු. එනම් මෙකී සඟරා විශේෂය, පර්යේෂණ මගින් නව සොයා ගැනීම් ආදියත්, න්‍යායන් ආදියත් විවිධ ක්ෂේත්‍ර වල නව තොරතුරුත් ලබා දීම වෙනුවෙන් වැදගත් තැනක පිහිටන බවයි. මෙබඳු තත්ත්වයක් තුළ වාරසඟරා (Periodical) විශේෂ පුස්තකාල වල සැළකිය යුතු මෙහෙවරක යෙදෙන තොරතුරු මූලාශ්‍රයක් ලෙස හැඳින්වීම උචිත වේ. විශේෂ පුස්තකාලයක විඥාපන සම්පත් අතුරින් 75% ක් පමණ වාරසඟරා නියෝජනය වීම අත්‍යාවශ්‍ය කරුණක් සේ සැලකේ.

වාර ප්‍රකාශන යටතේ විවිධ ස්වරූපවල වාරසඟරා තොරතුරු විඥාපන ක්ෂේත්‍රය තුළින් හඳුනා ගැනීමට පුළුවන. වාරප්‍රකාශන පුස්තකාල එකතුවට වැදගත් වන්නේ හේතු දෙකක් මත බව පී.කේ. මහාපත්‍ර දක්වයි. එනම්,

1. ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්හි මේ දක්වා ප්‍රකාශයට පත් වී නොමැති නවතම හා කාලීන දැනුම වාර සඟරාවලින් ඉදිරිපත් වීම.
2. වාරසඟරාවල අන්තර්ගත තොරතුරු බොහෝවිට ග්‍රන්ථවල අන්තර්ගත නොවීම යනුයි.

වාරසඟරා වර්ග කීපයක් ම ඉහත සහ තවත් සාධක මත විඥාපන ක්ෂේත්‍රයේ සංසරණය වන බව පෙනීයයි. වාරසඟරා වර්ග කිරීම කරුණු කීපයක් මත රඳා පවතී. එනම් අන්තර්ගතය, නිකුත්කිරීමේ අධිකාරිය සහ අනුකාලිකතාව අනුව වේ. නිර්මාණ සාහිත්‍ය, ඒ ඒ විෂයන්හි තොරතුරු අධ්‍යයනය, විද්‍යාත්මක සොයා ගැනීම්, තාක්ෂණික සංවර්ධනයන් විද්වත් සාකච්ඡා, නියත විෂය ක්ෂේත්‍රයන්හි ගැඹුරු අධ්‍යයන, පවත්නා දැනුම පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණ, දිනපතා ප්‍රවෘත්ති, ප්‍රවෘත්ති සාරාංශ,





කාලීන මාතෘකා හෝ පුවත් පත්‍රිකා යනාදි වශයෙන් වාරසඟරාවල අන්තර්ගතය. විවිධ විය හැකි ය. එමෙන් ම අනුකාලිකතාව ද දිනපතා, සතියට දෙවරක්, සතිපතා, දෙසතියකට වරක්, මාසික, මාසයකට දෙවරක්, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික විය හැකිය.

ඉහත කරුණු වලට අදාළව වාරසඟරා වර්ග පහත එන ආකාරයට දල වශයෙන් වර්ග කෙරේ.

i. පුවත් වාරසඟරා
ii. ශාස්ත්‍රීය වාරසඟරා
iii. විනෝදාස්වාදය සඳහා සැහැල්ලු කියවීමට යෝග්‍ය වාරසඟරා
iv. විචාර වාරසඟරා
v. අනුක්‍රමනිකාරක / සාර සංග්‍රහ වාරසඟරා වශයෙනි.

විශේෂ පුස්තකාලයක විඥාපන සම්පත් අතුරින් 3/4 ක නියෝජනයක් දක්වන වාරසඟරා කිසියම් පාලනයකට යටත්ව ඇණවුම් කිරීම, ප්‍රතිග්‍රහනය කිරීම, ප්‍රදර්ශනය කිරීම, පාඨකයාට ලබා දීම, බාහිර ආයතන වෙත යොමුකිරීම ආදිය සිදුවේ. වාරසඟරා පිළිබඳව විශේෂ සේවයක් කළ De Solla Price, මේවා අනාගත පරපුර සඳහා සංරක්ෂණය කළයුතුව ඇති බව ද ප්‍රකාශ කළේ ය. හේතුව වන්නේ නව පර්යේෂණ හා නව ප්‍රකාශන පිළිබඳ තොරතුරු අනාගතයට වැදගත් වන හෙයිනි. එබැවින් මෙබඳු සම්පත් විශේෂ පුස්තකාලවල ප්‍රබලතම තොරතුරු මාධ්‍යයක් වන්නේ ය.

විශේෂ පුස්තකාලයකට එබඳු තොරතුරු මූලාශ්‍ර (වාරසඟරා) වැදගත් වීම සඳහා බලපානු ලබන තවත් කරුණු කීපයක් වේ. එනම්,

1. කලට වේලාවට පළ කිරීම
(Timeliness)
2. නියමිත කාලපරිච්ඡේදයක් තුළ දී නිකුත් කිරීම.
(Preodicity)
3. අඛණ්ඩතාව
(Continuous)
4. වාරසඟරා සැලැස්මක් තිබීම
(Periodical programme)

**පාදක සටහන්** 5. ජනප්‍රියභාවය ඇති කිරීම
(Populatue)
6. විශ්ව ව්‍යාප්ති කළ යුතුයි.
(Universitily)
7. අදාළ අනුමාතෘකා පිළිවෙළට
(Collectieuness)
8. කර්තෘ මණ්ඩලයක් සිටීම
(Association of an editorial board)
9. යාන්ත්‍රික ප්‍රකාශනයක් විය හැක.
(Mechanical Reproduction)

උක්ත කරුණු ආශ්‍රිත වැදගත්කම දරන විට ප්‍රථමව සංක්ෂිප්තව දක්වන ලද වාරසඟරා කීපයක් පිළිබඳව නිදසුන් සහිත විස්තර පහත දක්වමු.

## පුවත් වාර සඟරා

වාර ප්‍රකාශවලින් එක් සුළු කොටසක් වනුයේ පුවත් වාරසඟරාය. Time, Newsweek, Asia week, Library Assosiatioan , Record වැනි ප්‍රකාශන ඒ සඳහා නිදසුන් කීපයක් වේ. මෙම සඟරාවල අන්තර්ගතය වනුයේ කාලීන පුවත් හා ඊට අදාළ විශේෂාංග සහිත වීමයි. ඇතැම්විට මේවායෙහි ශාස්ත්‍රීය වටිනාකම බෙහෙවින් අඩු නමුත් පාඨකයන්ගේ අවශ්‍යතා සලකා බැලීමෙන් යම්තරමකට හෝ වැදගත්කමක් දරනු ඇත. පුවත් සඟරා පසුගිය කලාප එකතු සංවිධානය ද බොහෝ විට සිදුවන්නේ ඉතාමත් අඩුවෙනි. පුවත්පතකට හෝ පුවත් වාරසඟරාවකට ඇති ඉල්ලුම කාලයත් සමග බෙහෙවින් හීන වන හෙයිනි. පුවත් වාරසඟරාවන්හි පළකෙරෙන විෂයානුබද්ධ විශේෂාංග හෝ ලිපි වෙන් වශයෙන් එකතුකොට තබා ගැනීමට කටයුතු කරන්නේ නම් විශේෂ පුස්තකාලවලට පමණක් නොව ඕනෑම පුස්තකාලයකට වැදගත් වනු ඇත. වාරසඟරා හෝ පොත් යනාදිය මුද්‍රණය වීම අඩු බවක් පෙනේ. එය පුස්තකාලයීය පරිහරණයටත්, නඩත්තුවත් ගැටලු ඇති කරයි. කෙසේ නමුත් පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලන එක්තරා ප්‍රකාශන විශේෂයක අනු විශේෂයක් වශයෙන් පුවත් වාර සඟරා කාලීන මෙහෙවරක යෙදෙන බව පෙනේ.





## ශාස්ත්‍රීය වාරසඟරා

වාර ප්‍රකාශන අතුරින් පර්යේෂණයන්ට වඩාත් විශේෂ වැදගත් කමක් ගනු ලබන විශේෂයක් ලෙස ශාස්ත්‍රීය වාරසඟරා හැඳින්විය හැකිය. මේවා ප්‍රධාන වශයෙන් විද්වත් සංගම්, විශ්ව විද්‍යාල, පුමුඛ ප්‍රකාශන සමාගම්, පර්යේෂණ ආයතන හා රසායනාගාර ආදිය මගින් ප්‍රකාශනයට පත් කෙරේ. මේ අතරින් ද, පළ කෙරෙන ලිපිවල සාධිකාරිත්වය හා ගුණාත්මක භාවය තහවුරු කිරීම සඳහා විමර්ශයක් ලවා ලිපි විමර්ශනය කිරීමෙන් පසුව පමණක් පළ කෙරෙන විමර්ශිත සඟරා. (Refreed Journals) වඩාත් වැදගත් වේ. ශාස්ත්‍රීය වාරසඟරා පාඨකයින් අතරත් විශේෂ පුස්තකාල අතරත් බහුල ලෙස ජනප්‍රියව ඇත. මෙයට විෂයාන්තර සම්බන්ධය මූලික වේ. මේ සඳහා නිදසුන් වශයෙන්, Journal of the American Chemical Socitety, Nature Journal of Librarianship ආදී සඟරා දැක්විය හැකි ය. උක්ත වාරසඟරා, සඳහා පර්යේෂකයින් ලිපි සැලසුම් කරනුයේ, අදාළ සඟරවේ චූලික ප්‍රතිපත්ති යටතේ ය. හැඳින්වීම, පරමාර්ථ, ක්‍රමවේද, ප්‍රතිඵල, සාකච්ඡා (විවරණ) යටතේ ලිපි පළකෙරේ. මූලික අත්පිටපත නිදහස් පුද්ගලයින් දෙදෙනකු මගින් කියවා එහි අදාළ බව සහ ලියුම්කරුගේ ම නිර්මාණයක් බව තහවුරු කිරීමෙන් පසුව පළකිරීම විශේෂ කරුණක් වේ. එබැවින් ශාස්ත්‍රීය වාරසඟරා විශේෂ හා පර්යේෂණ පුස්තකාල සඳහා ප්‍රබල තොරතුරු මාධ්‍යයක් වන්නේ ය. ඇතැම් පර්යේෂකයින් වෙනත් කෘතිවල ග්‍රන්ථ විවරණ බලාපොරොත්තු වෙති. මෙය පාඨකයන්ට මෙන්ම ලේඛකයන්ගේ ද ඉදිරි කටයුතු සඳහා බලපානු ලබන සිද්ධියක් වන්නේ ය. මෙබඳු ශාස්ත්‍රීය වාරසඟරා සඳහා ලිපි නිකුත් කර ඒවා පළකිරීමෙන් අනතුරුව ඇතැම් විද්‍යාර්ථීන්ට උසස්වීම් සඳහා ලකුණු ලබාගත හැකි ය. ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල පළවීම විශේෂ කරුණකි. එකී ලිපිවල සඳහන් තොරතුරු නව සොයාගැනීම් තවත් පර්යේෂකයින් මූලාශ්‍ර වශයෙන් ප්‍රයෝජනයට ගන්නා ස්වරූපය මත මුල් ලිපිකරුට වඩාත් ප්‍රතිඵල ලබාදේ. එවැනි හේතු මත විශේෂ පුස්තකාල සහ පර්යේෂණ පුස්තකාල තුළ ශාස්ත්‍රීය වාරසඟරා සඳහා විශේෂ අවධානයක් මෙන්ම විශේෂ ඉල්ලුමක් ද ඇති බව පෙනේ.

### විනෝදාස්වාදය හෝ සැහැල්ලු කියවීමට යෝග්‍ය සඟරා

වාරසඟරා අතරින් සුළු ප්‍රමාණයක් උක්ත කරුණ අරමුණු කරගනිමින් නිකුත් කෙරේ. ඇතැම්විට මේවා වාණිජ මට්ටමේ සඟරා

වශයෙන්ද හැඳින්විය හැකිය. මනහර, මුතුහර, දෙසතිය, කල්පනා, සංඛ, පද්ම, වාරණ ආදී වූ හෝ එබඳු තවත් සඟරා ඊට නිදසුන් ය. ශාස්ත්‍රීය මට්ටම එතරම් ඉහළ නැත. එහෙත් මූලාශ්‍ර වශයෙන් ලබාගත හැකි, ඇතැම් තොරතුරු මෙන්ම විනෝදාස්වාදය සඳහා ද කරුණු මේවාහි ඇත. ඕනෑම පුස්තකාලයක විනෝදාස්වාදය සඳහා කියවීමටදේ තිබිය යුතුය යන්න පිළිගෙන තිබේ. එබැවින් විශේෂ හෝ පර්යේෂණ පුස්තකාලයක් තුළ උක්ත මට්ටමේ සඟරා එකතුවක් තිබීම යෝග්‍ය වේ. පාඨකයන්ගේ විවේකය මේ සඟරා කියවීමට යොදා ගැනේ.

## විචාර වාරසඟරා

විචාර වාරසඟරා මගින් කිසියම් නිශ්චිත කාලසීමාවක් තුළ කිසියම් විෂයයක් හෝ විෂය ක්ෂේත්‍ර කීපයක් යටතේ ප්‍රකාශිත සාහිත්‍යය පිළිබඳ ගවේශනාත්මක ලිපි ප්‍රධාන වශයෙන් මේවායින් (Review Journals) ඉදිරිපත් කෙරේ. විචාර සඟරා කලාපයට අදාළ සමාලෝචිත කාලය තුළ පළවී ඇති ප්‍රධාන ලිපි පිළිබඳ සමාලෝචනයක් පාඨකයාට මෙමගින් ලබාදේ. මේ හෙයින් අනුක්‍රමණිකාකරණ, සාරසංග්‍රහකරණ වාරසඟරා මෙන්ම විචාර සඟරා ද ද්විතීයික සාහිත්‍යය මූලාශ්‍රයක් සේ භාවිතා කෙරේ. විශේෂ හා පර්යේෂණ පුස්තකාල සඳහා මේ තොරතුරු මූලාශ්‍ර ප්‍රයෝජනවත් වේ.

## අනුක්‍රමනිකාකරණ / සාරසංග්‍රහකරණ වාරසඟරා

විද්‍යාත්මක හා පර්යේෂණ ක්ෂේත්‍රයේදී බහුල ලෙස බලාපොරොත්තු වන සහ භාවිතා කෙරෙන වාරසඟරා වර්ග දෙකක් ලෙස උක්ත සඟරා හැඳින්විය හැකි ය. ප්‍රධාන පෙළේ ද්විතීයික මූලාශ්‍ර ගණයේ ලා සැළකිය හැකි එම වාරසඟරා විශේෂ හා පර්යේෂණ පුස්තකාලවල භාවිතය සඳහා අනිවාර්යයෙන් ම තිබිය යුත්තේ ය. විෂයානුබද්ද සම්බන්ධතාවය මත විවිධ ක්ෂේත්‍ර ඒවා නියෝජනය කරයි. මේ අතරින් Chemical Abstracts, Biological Abstracts, Library and Information Abstracts, Entomology Abstracts, Dissertation Abstracts, British Technology Index, Curren Contents, Science Citation Index ආදිය මූලික නිදසුන් වේ.





ද්විතියික තොරතුරු මූලාශ්‍ර රැසක් ම මේ ගණයට අයත් සඟරාවලට අන්තර්ගත වේ. මින් සාරසංග්‍රහකරණ සඟරාවල ඇති සංලේඛ සමග අදාළ ලිපිවල සාරසංග්‍රහයක් ද ඇතුලත් බැවින් බෙහෝ අවස්ථාවලදී එම සාර සංග්‍රහය කියවීම පමණක් ප්‍රමාණවත් වීමට ඉඩ ඇත. තවද සාරසංග්‍රහකරණය සඟරාවක් අදාළ විෂය ක්ෂේත්‍රයේ වැදගත් වාර ප්‍රකාශන ඉතා වැඩි කොටසක් ආවරණය කරන බැවින් ඒ තුළින් ඉතා වැඩි වාරසඟරා සංඛ්‍යාවක් පිළිබඳව අවධානය යොමු කිරීමට ඉඩ සැලසේ. මීට අමතරව Chemical Abstracts වැනි ප්‍රකාශනයක ඉංග්‍රීසි හැර වෙනත් විදේශීය භාෂාවන්ගෙන් ප්‍රකාශිත ලිපිවල ඉංග්‍රීසි බසින් වන සාරසංග්‍රහයක් ඉදිරිපත් කෙරෙන බැවින් ප්‍රයෝජනවත් වේ.

ලබාදෙන මෙහෙය හේතුකොටගෙන වාරසඟරා පුස්තකාල ක්‍රියාදාමයේ අත්‍යාවශ්‍ය අංගයක් වන්නේ ය. විශේෂයෙන්ම මෙය විශේෂ පුස්තකාල සඳහා අදාළ වේ. ලංකාවේ විශේෂ පුස්තකාල අතරින් 1936 දී පිහිටුවන ලද රබර් පර්යේෂණායතනයේ (අගලවත්තේ පිහිටි) පුස්තකාලය තුළ සඟරා 3000 ක් ඉක්මවා ඇතැයි කියවේ. රබර් පර්යේෂණ ආශ්‍රිතව ලියැවී ඇති විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ ලිපි සහිත වාරසඟරා මෙතුළ අන්තර්ගත වේ. එබැවින් රබර් පිළිබඳව පර්යේෂණ හෝ ශාස්ත්‍රීය මට්ටමේ සොයැබැලීම් කරනු ලබන අය සඳහා උක්ත පුස්තකාලයීය වාරසඟරා එකතුව පරිශීලනය කිරීම යෝග්‍ය මෙන්ම කාලෝචිත ද වනු ඇත.

තලවකැලේ පිහිටි තේ පර්යේෂණායතන පුස්තකාලය ද එකී ක්ෂේත්‍රයේ පර්යේෂණ ආයතනයේ පිළිබඳව තොරතුරු සහිත වාරසඟරා එකතුවක් සඳහා හිමිකම් කියයි. දේශීය හෝ විදේශීය වශයෙන් තේ ආශ්‍රිත තොරතුරු සොයන පාඨකයාට ඉන් ලැබෙන පිටුවහල වැදගත් ය. මෑතකාලීන පර්යේෂණ පමණක් නොව පූර්වකාලීන පර්යේෂණ ද මේ වාරසඟරා තුළින් දැන ගැනීමට ඉඩ ඇත.

ලංකාවේ පිහිටි තවත් විශේෂ පුස්තකාලයක් වශයෙන් පොල් පර්යේෂණ ආයතනයේ පුස්තකාලය හැඳින්විය හැකි ය. මෙය ලුනුවිල පිහිටයි. දැනට මෙහි වාරසඟරා 10,000 ප්‍රමාණය ඉක්මවා ඇති බව කියැවෙන අතර පොල් ආශ්‍රිත ක්ෂේත්‍රයේ බෙහෝ තොරතුරු මෙම

වාරසඟරා එකතු තුළින් ලබා ගැනීමට ඉඩ තිබේ. දේශීය හා විදේශීය ලෙසින් මෙහි දෙ ආකාරයක සඟරා ඇත. පොල් වගාවේ රෝග පිළිබඳ තොරතුරු ගවේෂණය කරන අයෙකුට එකී පුස්තකාලයීය වාරසඟරා එකතුව තුළින් සාහිත්‍ය මූලාශ්‍ර රැසක් ලබාගැනීමට පුළුවන් වේ. එය ඉතා සරල නිදර්ශනයක් පමණක් වනු ඇත.

ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණායතන පුස්තකාලයේ සඟරා 4000 ක් ඉක්මවා ඇති බව වාර්තා වේ. වාර ප්‍රකාශන අතරේ ඇති විශේෂිත වාරසඟරා කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා තොරතුරු ලබාදේ. දිවයිනේ එතරම් ප්‍රසිද්ධියක් නොමැති මෙම පුස්තකාලයෙන් විවිධ කර්මාන්ත ආශ්‍රිත තොරතුරු සහිත සඟරා මෙහි සංවිධානව පවතී. රාජ්‍ය සහ පෞද්ගලික අංශවල කාර්මික ක්ෂේත්‍රය සඳහා විවිධ තොරතුරු ලබා ගැනීමේ හැකියාව මහජනතාවට (පාඨකයාට) ලබා දේ.

මහ බැංකුවේ පර්යේෂණ විශේෂ පුස්තකාලය තුළ ද විවිධ පර්යේෂකයින්ට අදාළ වන සඟරා එකතුවක් නඩත්තු කෙරේ. විශේෂයෙන් ම ආර්ථික ක්ෂේත්‍රයේ (මූල්‍ය ආදී) තොරතුරු ගවේෂණය කරන්නවුන් සඳහා මෙය ක්‍රියාත්මක වේ. වාරසඟරා 500 ක් පමණ හා විෂය අනුක්‍රමණිකා සඟරා ද මෙහි ඇතුළත් ය. රටෙහි ආර්ථික ක්ෂෙත්‍රයේ ප්‍රවර්ධනය සඳහා පර්යේෂණ ආර්ථික හා මූල්‍ය විද්‍යාව යටතේ අවශ්‍ය වේ. එබඳු පර්යේෂකයින් සඳහා තොරතුරු සැපයෙන වාරසඟරා මෙහිදී වැදගත් වේ.

ලෝකයේ විශේෂ පුස්තකාල කොතෙකුත් ඇත්තේ ය. ඒ ඒ විෂයානුබද්ධ කරුණු සම්බන්දයෙන් එකිනෙකට විවිධය. පොදුවේ ගත්විට පර්යේෂණ, නව සොයාගැනීම් ආදියෙන් යුකත නව තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා වාරසඟරා ප්‍රධාන මූලාශ්‍ර ලෙස ම භාවිත කරයි. ජාත්‍යාන්තර වශයෙන් බොහෝ සම්බන්ධතා දක්වන එක්තරා විශේෂ පුස්තකාලයක් සහ එහි වාරසඟරා නිකුත් කෙරෙන විෂයන් කීපයක් පිළිබඳව පහත නිදසුන් ඉදිරිපත් කරමු. අන්තර්ජාල ගවේෂණය අනුව විවිධ වූ විශේෂ පුස්තකාල අධ්‍යයනය කිරීමට අපට ඇති අවස්ථා ඉතා වැදගත් ය. ඒ අනුව, ඇමරිකා එක්සත් ජනපදයේ එක්තරා විශේෂ පුසතකාලයක් නිදසුන් වශයෙන් දක්වමු.





## විශේෂ පුස්තකාලය

Florida Institute of Phosphate Research Library (U.S.A)*

උක්ත පුස්තකාලය ෆ්ලෝරිඩාවේ (Florida) නීති සම්පාදන මණ්ඩලය මගින් 1978 දී ආරම්භ කරන ලද්දකි. මෙහි පරමාර්ථ වනුයේ පොස්පේට් ආකර ආශ්‍රයෙන් නියත වශයෙන්ම ඇතිවන්නා වූ පාරිසරික සට්ටන අවම කිරීම සහ ආර්ථික අතින් කර්මාන්ත වැඩි දියුණු කිරීමේ වගකීම දැරීමයි. ඉඩම් ප්‍රතිසංස්කරණය සඳහාත් ආකර ආශ්‍රිත තාක්ෂණික අංශවල සංවර්ධනය සඳහාත් මෙය අදාල වේ.

උක්ත ආයතනයේ පුස්තකාලය ඉහත පරමාර්ථය සඳහා ලංවිය හැකි ආකාරයේ විඥාපන සම්පත් එකතු කිරීම, පළකිරීම, සංවිධානය කිරීම, බෙදාහැරීම, ආදිය ක්‍රියාත්මක කරයි. එකී විඥාපන සම්පත් ආශ්‍රයෙන් වඩාත් ප්‍රබල මාධ්‍යයක් ලෙස වාරසඟරා ඉදිරියෙන් සිටී. පුස්තකාල එකතුව පිළිබඳව ඔවුන්ගේ පොදු ප්‍රකාශය මෙසේ ය. "The FIPR Library houses a unique collection of phosphate related journals (current and retrospective) books/documents, patents, videos, maps and FIPR research publication. It is the only such collection in the united states and probably the worls"

ඉහත ප්‍රකාශයට අනුව පෙනී යන්නේ වර්තමාන සහ පසුගිය වාරසඟරා ඇතුලු විඥාපන සම්පත් රැසක් සහිත එකතුවක් (unique) ඇති බවයි. එබඳු එකතුවක් ඇත්තේ එහි පමණි. යන්න සඳහන් වීම ද විශේෂ පුස්තකාලයක් යන්නට කදිම සුදුසුකමකි. අපට මෙහි දී වඩාත් වැදගත් වනුයේ එකී පුස්තකාලයේ වාරසඟරා එකතුවයි. වර්තමාන සහ පසුගිය (Current and retrospective) වාරසඟරා විශාල ප්‍රමාණයක් එහි ඇති බව අන්තර්ජාලය ආශ්‍රයෙන් දැනගත හැකි ය. ඒ අනුව මතු දැක්වෙන විෂයයන් නියෝජනය කරන්නා වූ වාරසඟරා එකතුවක් එම විශේෂ පුස්තකාලයේ විඥාපන සම්පත් අතුරේ අන්තර්ගත බව පෙනේ. එනම්,

රසායන විද්‍යාව (Chemistry), පොහොර තාක්ෂණය (Fertilizer Technology), කෘෂිකර්මය (Agriculture), පොස්පෝජිප්සම් (Phosphogypsum), භූගර්භ විද්‍යාව (Geology), ආකාර (minig) ඛණිජ ප්‍රතිසැකසුම් (minerral processing), පරිසර විද්‍යාව (envioronmental), කිරණ ස්ඵුරණය (radiations), රේඩන් (rardon) සහ අස්වැද්දීම් (reclamation) යනාදියයි.

නිදර්ශිත උක්ත විශේෂ පුස්තකායේ කාර්යයභාරය තීව්‍ර කිරීම සඳහා ඉහත විෂයන්ට අදාළ වාරසඟරා මහගු සේවයක් ඉටුකරනු ලබන බව පෙනී යයි.

ඉහත තොරතුරු අනුව, විශේෂ පුස්තකාල හා වාරසඟරා අතර ඇති සම්බන්ධය යම්තාක් දුරට අවබෝධ වේ. වාරසඟරා සඳහා විශේෂ පුස්තකාල ද විශේෂ පුස්තකාල සඳහා වාරසඟරා ද යන කාරණා දෙක එකට බද්ධ ව හෝ සමීප සම්බන්ධයක් දක්වන බව පෙනීයයි. එබැවින් වාරසඟරා වල වැදගත්කම ගණනය කිරීම අපහසු වනවාක් මෙන්ම විශේෂ හා පර්යේෂණ පුස්තකාල වල වාරසඟරා සම්බන්ධයෙන් සිදුකෙරෙන්නා වූ කටයුතු ද සුළුපටු නොවේ.

දිනේ දින දියුණුවන්නා වූ තොරතුරු තාක්ෂණයේ මෙහෙය මත මෙම වාරසඟරා හා විශේෂ පුස්තකාලවල කාර්යභාරය තව දුරටත් දියුණු වීමට ඉඩ ඇත. එබැවින් වාරසඟරා සහ විශේෂ පුස්තකාල යන ක්ෂේත්‍ර දෙක තුළින් ලබාදෙන මෙහෙවර විශේෂීකරණයට බඳුන් කිරීම කාලෝචිත ය.





**මූලාශ්‍ර :**


1. Bose, H. Information science : principal and practice - New Delhi : Sterling 1986.
2. Encyclopedia of library and informatioan science, Marccel Dekker - Newyork : 1978
3. JULA, 2(l) 1998.
4. Kawatra, P.S The Library and informatioan studies hand book - NeW Delhi : Crest, 1996
5. ජයතිස්ස, එල්. ඒ පුස්තකාල කළමණාකරණය - කැලණිය : කර්තෘ 1999
6. ජේම්ස්, තොම්සන්, පුස්තකාල බලය - ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1984
7. ධණපාල , ගුණසේකර පුස්තකාල සේවාවේ මූලිකාංග කොළඹ : ගොඩගේ, 1998
8. පුස්තකාල ප්‍රවෘත්ති. 16/3, 1995 ජූලි - සැප්තැම්බර්
9. .......................... 16/4, 1995 ඔක් - දෙසැම්බර්
10. .......................... 20/2, 1999 අප්‍රේල් - ජූනි
11. .......................... 23/1, 2002 ජනවාරි - මාර්තු
12. වීරසිංහ, ඩබ්.කේ. එම්. එම්. කේ පුස්තකාල ඉතිහාසය - දළුගම : කර්තෘ, 2000
13. .................................. පොත පත වග තුග - දළුගම : කර්තෘ, 2002